# කුලී සහන ක්‍රියාවලිය

විස්තර පත්‍රිකාව
2020 මැයි

## 2020 මාර්තු 29 දිනට පසු මාගේ කුලිය ගෙවීමට මට නොහැකිනම්, කුමක් කල යුතුද?

සුදුසුකම් ඇති කුලී නිවැසියන් විසින් කොරෝනා වයිරස් වසංගතය හේතුවෙන් මූල්‍ය දුෂ්කරතා ඇති බව ස්ථාපනය කල යුතුය.

1 වන පියවර:

- ගැටළුව නොසලකා නොසිටින්න - කුලිය නොගෙවීම ඔබගේ කුලී නිවෙස් ගිවිසුම උල්ලංඝණය කිරීමකි. ඔබගේ අයිතිවාසිකම් සහ වගකීම් සම්බන්ධ තොරතුරු සහ උපදෙස් සඳහා Consumer Affairs Victoria වෙබ් අඩවිය වෙත පිවිසෙන්න
- ඔබගේ කුලී නිවෙස් හිමියා හෝ දේපළ කළමණාකරු හා සම්බන්ධවී, ඔබගේ තත්වය සම්බන්ධයෙන් දැනුවත් කර අනාගත කුලී ගෙවීමට නොහැකි අවදානමක සිටින බව දැනුම් දෙන්න
- ඔබට ලැබිය හැකි ආදායම ඇස්තමේන්තු කර ඔබට කුලිය වශයෙන් ගෙවිය හැකි මුදල ගණනය කරන්න - මෙහිදී ඔබට ලබාගත හැකි කොමන්වෙල්ත් ආදායම් උපකාර ගෙවීම් ඇතුළු වෙනත් මූල්‍ය උපකාර සම්බන්ධයෙන්ද සැලකිල්ලට ගන්න (10 වන පියවරද බලන්න)
- Department of Health and Human Services (DHHS) යටතේ ඇති කුලී සහන වැඩසටහන ඇතුළු රජයේ ආධාර සඳහා ඔබට ඇති සුදුසුකම්ද සලකා බලන්න (9 වන පියවර බලන්න)

2 වන පියවර:

- ඔබගේ කුලී නිවෙස් හිමියා සමග කුලිය අඩුකර ගැනීම සම්බන්ධ ඉල්ලීමක් කරන්න (ඍජුවම හෝ දේපළ කළමණාකරු හරහා)

3 වන පියවර:

- නියමිත කාලයක් සඳහා අඩුකල කුලියකට එකඟතාවයකට පැමිණෙන්න උත්සාහ කරන්න.

4 වන පියවර:

- එකඟතාවයේ ප්‍රතිඵලය සමග Consumer Affairs Victoria (CAV) හා සම්බන්ධවන්න, නැතිනම් අපහසුතා ඇතිනම්, උපකාර ඉල්ලා සිටින්න

## මා CAV හා සම්බන්ධවූ විට කුමක් සිදුවේද?

5 වන පියවර:

- CAV මගින් ඔබ එකඟතාවයට පැමිණි ගිවිසුම වාර්තා කරන අතර, අවශ්‍යනම්, එකඟතාවයකට පැමිණීමට උපකාර කරනු ඇත

- ඔබට තවමත් එකඟතාවයකට පැමිණීමට නොහැකිනම්, නොමිලේ සමථකරණයක් සඳහා Dispute Settlement Centre of Victoria (DSCV) වෙත යොමු කරනු ඇත

## DSCV හිදී කුමක් සිදුවේද?

6 වන පියවරඃ

- අන්‍යෝන්‍ය එකඟතාවයකට පැමිණීම සඳහා බලයලත් සමථකරුවෙකු ඔබ සමඟ කටයුතු කරනු ඇත

7 වන පියවරඃ

- ක්‍රියාවලිය අවසානයේ එකඟතාවය සම්බන්ධ වාර්තාවක් හෝ බැඳ තබන නියෝගයක් නිකුත් කරනු ඇත

8 වන පියවරඃ

- සමථකරණ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් අවසන්වූ පසු මතභේදයට ලකවුණු ප්‍රතිඵල VCAT හිදී අවසාන බේරුම්කරණයට හෝ අධිකරණ නියෝගවලට යටත්වේ.

## කුලී නිවැසියන් සඳහාවූ අමතර පියවර

9 වන පියවරඃ

මම තවදුරටත් මාගේ ආදායමෙන් 30%කට වඩා කුලී වශයෙන් ගෙවයි නම්, කුමක් කල යුතුද?

- ඔබගේ කුලී නිවෙස් හිමියා සමඟ එකඟතාවයකට පැමිණීමෙන් පසු, ඔබගේ ආදායමෙන් 30% කට වඩා කුලී වශයෙන් ගෙවයිනම්, කුලී සහන සඳහා වික්ටෝරියානු රජයේ ප්‍රදානයකට සුදුසුකම් තිබිය හැකිය. ඔබ ආදායම් සහ වත්කම් පරීක්ෂණ සපුරාලන්නේ නම්, $2,000 දක්වා කුලී සහන ගෙවීමක් වශයෙන් ලබාගත හැකිය. මෙම ගෙවීම ඔබ සහ ඔබ සහ ඔබගේ කුලී නිවෙස් හිමියා අතර ඇතිවුණු කුලිය අඩුකරගැනීමේ එකඟතාවයට අමතරව වන අතර DHHS මගින් ඔබගේ කුලී නිවෙස් හිමියාට ඔබගේ කුලී ගෙවීම් සම්බන්ධ ගෙවීමක් වශයෙන් සිදු කරනු ඇත.

10 වන පියවරඃ

මා කුලී සහන ප්‍රදානයකට සුදුසුකම් නොලබයි නම්, වෙන කුමන උපකාර මා හට ලබාගත හැකිද?

- DHHS මගින් පුද්ගලික කුලී නිවෙස්වල සිටින අය හට පුළුල් පරාසයක තොරතුරු සහ සේවා ලබාදේ - කරුණාකර, https://www.housing.vic.gov.au/help-renting වෙබ් අඩවිය වෙත පිවිසෙන්න. ඔබට කොමන්වෙල්ත් කුලී උපකාර සඳහාද සුදුසුකම් තිබිය හැකිය.

## මා විසින් කුලී ගිවිසුම කලින් අවසන් කල හැකිද?

- සීමිත අවස්ථාවල කුලී නිවෙස් හිමියෙකු හෝ කුලී නිවැසියෙකු විසින් කුලී ගිවිසුම අවසාන කිරීමට ඉල්ලා සිටිය හැකිය. මේවා අතරට මූල්‍ය දුෂ්කරතා, දේපළ වාසයට සුදුසු නොවන අවස්ථාවල, කුලී නිවෙස් හිමි දේපළ අලෙවි කර ඇතිවිට හෝ එම දේපලට පදිංචියට යන

අවස්ථාවල, හෝ කිසියම් පාර්ශ්වයක් අනෙක් පාර්ශ්වයේ ආරක්‍ෂාව අවදානමේ දමන අවස්ථාව හෝ දේපළට ද්වේශ සහගත ආකාරයට අලාභහානි සිදුකර ඇති අවස්ථා ඇත. පවුල් හිංසන අවස්ථාවල විශේෂ තත්ව අදාලවේ.